# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 58 දරන
# වෙළඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) (ඉවත් කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිළ: ශත 30 යි. තැපැල් ගාස්තුව: ශත 75 යි.

# 1988 අංක 58 දරන වෙළඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින.]

එල්. ඩී.—ඕ. 54/88.

## 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත ඉවත් කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත, 1988 අංක 58 දරන වෙළඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (1) 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත මෙයින් ඉවත් කරනු ලැබේ. — 1971 අංක 35 දරන පනත ඉවත් කිරීම.

(2) 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත ඉවත් කරනු ලැබුව ද, ඒ පනත යටතේ ආණ්ඩුව විසින් අත්කර ගන්නා ලද හෝ ආණ්ඩුව වෙත සතු වී ඇති හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයකට අදාළ ව, ඒ පනතේ 12 වන වගන්තිය යටතේ සාදනු ලැබ, මේ පනත ආරම්භ වීමට පෙරාතුව ම වූ දිනයෙහි බලාත්මකව පවත්නා සියලු නියෝග, එම වෙළෙඳ ව්‍යාපාරයේ කටයුතු කර ගෙන යාම, එම වෙළෙඳ ව්‍යාපාරය වෙනුවෙන් කළ යුතු වන ගෙවීම් තක්සේරු කිරීම සහ එම ගෙවීම් කිරීම සම්බන්ධයෙන් ගත යුතු වෙනත් පියවර සඳහා අවශ්‍ය වන තාක් දුරට, දිගටම වලංගුව පැවැතිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම **දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දැනක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.**